දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

මගේ අංකය )
எனது இல ) NA/14/03/2023
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2024.10.11
Date )

---

පොදු චක්‍රලේඛ ලිපි අංක - 02- 141 /2024

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර / ගාල්ල
ජේෂ්ඨිය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ශික්ෂණ රෝහල්/
මහ රෝහල්/මූලික රෝහල් හා විශේෂිත ආයතන ප්‍රධානීන් ඇතුළු
ජේෂ්ඨිය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (දෙහෙද මහජන සෞඛ්‍ය) තනතුරට අයදුම්පත් කැඳවීම.</u>**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (හෙද මහජන සෞඛ්‍ය) තනතුරට ජේෂ්ඨිය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල්/ ආයතන වල සේවය කරන 2024.10.28 දිනට පහත 04 ජේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් ක්‍රමය - මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03-2016 හි SL - 01/2016 (රු.47,615-10X1,335-8X1,630-17X2,170-110,895/-) වැටුප් පරිමාණය හිමි අතර, ඔබට වැටුප් ගෙවනු ලබන්නේ අදාළ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ය.

03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි - මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

04. අවශ්‍ය සුදුසුකම් -

I. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක සිටින නිලධාරියෙක් විය යුතු අතර අදාළ තනතුරේ යටත් පිරිසෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.

II. අදාළ කාලය තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල ම උපයාගෙන තිබීම හා පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01-2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

IV. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

05. තෝරා ගන්නා ක්‍රමය

ඉහත 04 හි සුදුසුකම් සහිත නිලධරයන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් ලබන නිලධාරියා තෝරා ගනු ලැබේ. අයදුම්කරුවන් විසින් අදාළ සුදුසුකම් අයදුම්පත් පියවන දිනය වන 2024.10.28 දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

---

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

| | | | | |
|---|---|---|---|---|
| I | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සේවා කාලයට | | | උපරිම ලකුණු 30 |
| | විශේෂ ශ්‍රේණියේ එක් වසරකට | | | ලකුණු 03 |
| | මාස 06 කට | | | ලකුණු 02 |
| | මාස 03කට | | | ලකුණු 01 |
| | ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හා 01/2019 (1) අනුව සිදු කෙරේ. | | | |
| II. | හෙද සේවයේ 1වන ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සේවා කාලයට | | | උපරිම ලකුණු 30 |
| | 1වන ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සක්‍රිය සතුටුදායක සේවා කාලය සඳහා වසරකට | | | ලකුණු 03 |
| | මාස 06 කට | | | ලකුණු 02 |
| | මාස 03 කට | | | ලකුණු 01 |
| | සටහන - ඉහත අංක 04 යටතේ මූලික සුදුසුකම් ලෙස සළකා බලන සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | | | |
| III. | ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් (සනාථ කිරීම සඳහා සහතික පත්‍ර මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය) | | | - උපරිම ලකුණු 25 |
| | අ | | හෙද ක්ෂේත්‍රයට ඍජුවම අදාළ වන අධ්‍යාපන සුදුසුකම් සඳහා | උපරිම ලකුණු 13 |
| | | 01 | පශ්චාත් උපාධිය (හෙද මහජන සෞඛ්‍ය) | ලකුණු 13 |
| | | 02 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | ලකුණු 11 |
| | | 03 | මූලික උපාධියක් සඳහා | ලකුණු 08 |
| | | 04 | ඩිප්ලෝමා පාඨමාලාවක් (මාස 06 කට හෝ පැය 720 ට නොඅඩු පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණු ඩිප්ලෝමාව හැර) | ලකුණු 06 |
| | සටහන - උක්ත අංක 01, 02 හා 03 යටතේ සඳහන් සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය/විදේශීය අධ්‍යාපන ආයතනයක් මඟින් ලබා ගත් සුදුසුකම් විය යුතු ය. අංක 04 යටතේ සඳහන් සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/අධ්‍යාපන/සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත අධ්‍යාපන ආයතනයක් මඟින් ලබා ගත් සුදුසුකම් විය යුතුය.<br>- ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | | |
| | ආ | | වෙනත් අධ්‍යාපන සුදුසුකම් සඳහා | - උපරිම ලකුණු 12 |
| | | 01 | තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | | 02 | දෙවන භාෂාව/සන්ධාන භාෂාව පිළිබඳ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | | 03 | කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | සටහන - ඉහත (ආ) යටතේ සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ අධ්‍යාපන/ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත ආයතනයක් මඟින් රජයේ පිළිගත් ලබාගත් කාලය මාස 06 කට හෝ පැය 720 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් විය යුතු ය. ඉහත එක් එක් ක්ෂේත්‍රයට අදාළව ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | | |
| IV. | ක්ෂේත්‍රයට අදාළ වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | | | - උපරිම ලකුණු 10 |
| | 01 | විෂයානුබද්ධ පර්යේෂණ, නිබන්ධන, ප්‍රකාශන හා පුවත්පත් සඟරා ආදියට සපයන ලද ලිපි | | ලකුණු 02 |
| | 02 | පුහුණු වැඩසටහන් මෙහෙයවීම/සම්බන්ධීකරණය | | ලකුණු 02 |
| | 03 | පුහුණු වැඩමුළු/සම්මන්ත්‍රණ (දේශීය/විදේශීය) සඳහා සහභාගී වීම. | | ලකුණු 02 |
| | 04 | ප්‍රශංසා (පොදු 230B ආකෘතිය අනුව වන ප්‍රශංසා සඳහා පමණක්) | | ලකුණු 02 |
| | 05 | සුවිශේෂී සේවා සැපයීම - ස්වාභාවික/හදිසි/වසංගත/ත්‍රස්ත විපත් තත්ත්වයන්. | | ලකුණු 02 |
| | සටහන -<br>එක් සහතිකයකට/ලිපියකට/ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් එක් නිර්ණායකයට උපරිම ලකුණු 02 බැගින් වන පරිදි විය යුතු අතර සියලු සුදුසුකම් අදාළ පරිදි සහතික සහ ලිපි ලේඛන මඟින් තහවුරු කළ යුතු ය. | | | |
| V. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | | | උපරිම ලකුණු 05 |
| | (කුසලතාව,නායකත්වය,ආකල්ප,පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා) | | | |
| | එකතුව | | | 100 |

07. අයදුම්පත ඉදිරිපත් කළ යුතු පිළිවෙල -

මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කර ගත් ඉල්ලුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් 2024.10.30 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
"සුවසිරිපාය"
අංක 385
සෞඛ්‍ය අමාත්‍යංශය
කොළඹ 10

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී.ජී.මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යංශය.